ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** මූල්‍ය බුද්ධි ඒකකය

**දිනය** 2020.05.12

## යුරෝපා කොමිසම විසින් ඉහළ අවදානම් සහිත තුන්වන පාර්ශවයේ රටවල් ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කිරීම.

යුරෝපා කොමිසම විසින් 2020 මැයි මස 7 දින ප්‍රකාශයට පත්කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ උපායමාර්ගික දුර්වලතා සම්බන්ධයෙන් ඉහළ අවදානම් සහිත තුන්වන පාර්ශවයේ රටවල් ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කිරීමට තීරණය කර ඇත.

2017 ඔක්තෝබර් මාසයේ දී මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ උපායමාර්ගික දුර්වලතා සහිත රටක් ලෙස 'අළු ලේඛන' ගත කිරීමත් සමග 2018 පෙබරවාරි මාසයේදී යුරෝපා කොමිසම විසින් ඉහළ අවදානම් සහිත තුන්වන පාර්ශවයේ රටක් ලෙස ශ්‍රී ලංකාව ලැයිස්තුගත කරන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාව 'අළු ලේඛන' ගත කිරීම සමග හඳුනාගත් උපායමාර්ගික දුර්වලතා මගහරවා ගැනීම සඳහා කාල රාමුවකට යටත්වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී.

ඒ අනුව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනෙකුත් පාර්ශවකරුවන් සමග ඉහත ක්‍රියාකාරී සැලැස්ම ලබාදුන් නිශ්චිත කාලරාමුව තුළ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2019 ඔක්තෝම්බර් 13 සිට 18 දක්වා පැරීසියේ පැවති මූල්‍ය කාර්ය සාධක බලකායේ සැසිවාරයේදී 'අළු ලේඛනයෙන්' ශ්‍රී ලංකාව ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

ප්‍රකාශයට පත් කරන ලද යුරෝපා සංගමයේ ඉහළ අවදානම සහිත තුන්වන පාර්ශවයේ රටවල සංශෝධිත ලැයිස්තුව සහ යුරෝපා කලාපය තුළ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳව වූ ප්‍රතිපත්තිමය විස්තීරණ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරියේ දී සම්මත කිරීම සඳහා යුරෝපා කවුන්සිලයට සහ යුරෝපා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතයි. යුරෝපා කොමිසම විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ සම්පූර්ණ ප්‍රකාශය https://ec.europa.eu/commission/presscorner/detail/en/ip_20_800 යන වෙබ් අඩවි යොමුවෙන් ලබාගත හැක.

මූල්‍ය කාර්ය සාධක බලකාය සහ යුරෝපා සංගමය විසින් ඉහත කී ලේඛනයන්ගෙන් ශ්‍රී ලංකාව ඉවත් කිරීමත් සමග පසුගිය දෙවසර තුළ දී එකී ලේඛනගත කිරීම තුළින් ඇති වූ අහිතකර බලපෑම් පහව යන අතරම ශ්‍රී ලංකාවේ ආර්ථික සහ මූල්‍ය සාධනීයත්වය තවදුරටත් ධනාත්මක ලෙස ශක්තිමත් වනු ඇතැයි බලාපොරොත්තු වේ.